සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

| 23 | S | I |
|---|---|---|


දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය ............................ දේශපාලන විද්‍යාව I කාලය පැය දෙකයි

- **මෙම ප්‍රශ්න පත්‍රය A - B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.**
- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුයි.**
- **එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

## A කොටස

- **අංක 1 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

01. දේශපාලනය,
    1. රාජ්‍ය සහ ජනතාව අතර පවතින සම්බන්ධතා ක්ෂේත්‍රයකි.
    2. පුද්ගලිකව මිනිසා තුළ පැන නගින්නකි.
    3. පුද්ගල අභිලාෂ වෙනුවෙන් පෙනී සිටින්නකි.
    4. දේශපාලනය පිළිබඳ ශාස්ත්‍රීය ඥානය ලබාගැනීමට පෙළඹවීමකි.
    5. මානව චර්යාවේ සැඟවුණු පැතිකඩකි. (.....)

02. දේශපාලන විද්‍යාව යනු,
    1. දේශපාලනය ප්‍රායෝගිකව හැදෑරීමක් මින් සිදුවේ.
    2. ආණ්ඩුබලය ලබාගැනීමට ක්‍රියාකාරී වීමකි.
    3. සටන් හා විරෝධතා දියත් කරමින් ඊට සහභාගී වීමකි.
    4. දේශපාලන ප්‍රපංචයන් විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමකි.
    5. එහි ආරම්භය නූතන යුගයෙන් ආරම්භ වුණි. (.....)

03. ආණ්ඩුව,
    1. රාජ්‍යයේ හිමිකරුවාවේ.
    2. ආණ්ඩුවේ කැමැත්ත ක්‍රියාවට නන්වන්නාවේ.
    3. ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතලවලට පටහැනිව කටයුතු කරන ආයතනය වේ.
    4. රාජ්‍යයේ කැමැත්තට එරෙහිව නැගී සිටින බල ආයතනයකි.
    5. රාජ්‍යයේ කටයුතු ඉටුකිරීමට මහජනතාව විසින් කෙටිකලකට බලය ලබාදෙන ආයතනය වේ. (.....)

04. ගෝලීයකරණය,
    1. මේ නිසා ජාතිය යන අදහසෙහි වැදගත්කම වැඩි වී තිබේ.
    2. ජාතික රාජ්‍යය ක්‍රමය අර්බුදයකට ඇද දැමීමට හේතුවේ.
    3. දේශසීමා අර්බුද උත්සන්න වීමට බලපායි.
    4. මාක්ස්වාදී දේශපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් වේ.
    5. දේශසීමා අර්ථවත් කරමින් බල ආධිපත්‍යය ගොඩනගයි. (.....)

05. ස්වාධීපත්‍යය,
1. එය සමාජයේ අනෙක් ආයතන තුළටද ව්‍යාප්ත වී ඇත.
2. එය අසහාය වන්නේ දේශසීමා තුළ පමණි.
3. රාජ්‍ය සතු අධිකාරී බලයකි.
4. ගෝලීයකරණය නිසා ස්වාධිපත්‍යය අභියෝගයට ලක්වී නැත.
5. අවශ්‍ය වූ විටෙක පහසුවෙන් බෙදිය හැකිවේ. (.....)

06. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය,
1. මිනිස් නිදහස තහවුරු කිරීම සඳහා ඇති වූ දේශපාලන මතවාදයකි.
2. මූලික වශයෙන් ධනවාදී හා සමාජවාදී ආර්ථික සමාජක්‍රම මත පදනම් වී ඇත.
3. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ප්‍රතික්ෂේප කරනු ලැබේ.
4. මහජන පාලනය යන සංකල්පයට එරෙහිව ක්‍රියාත්මක වේ.
5. ආණ්ඩුවේ හා සමාජයේ සීමාවන්ට යටත් වූ නිදහස් මතවාදයකි. (.....)

07. ෆැසිස්ට්වාදී රාජ්‍යය,
1. රාජ්‍යය සහ ජාතිය එකිනෙකින් වෙනස්කොට දක්වයි.
2. රාජ්‍යයේ සුපිරිභාවය උත්කෘෂ්ඨභාවය ප්‍රතික්ෂේප කරයි.
3. රාජ්‍යයේ ආයතන පිළිබඳ ක්‍රමානුකූල විග්‍රහයක් ෆැසිස්ට්වාදය මඟින් ඉදිරිපත් කරයි.
4. රාජ්‍යය හා පාලකයා සර්වසම වේ.
5. රාජ්‍යයෙන් වෙන් වූ සහ ස්වාධීන වූ පෞද්ගලික නිදහසක් පුරවැසියා සතුවේ. (.....)

08. ඒකීය ආණ්ඩුක්‍රමය යටතේ,
1. මධ්‍යම හා ප්‍රාන්ත ආණ්ඩු අතර ස්වාධිපත්‍යය බෙදාගනු ලබයි.
2. රාජ්‍යය ස්වාධිපත්‍යය මුළුමනින්ම මධ්‍යම ආණ්ඩුව වෙත රඳා පවතී..
3. ඉතාමත් සංකීර්ණ හා කාර්යක්ෂවතාවයෙන් අඩු ආණ්ඩුක්‍රමයක් ලෙස දක්වයි.
4. විවිධත්වය තුළින් එක්සත්කම ගොඩනගාගැනීමට උත්සාහ දරයි.
5. මධ්‍යම ආණ්ඩුවට සිය අභිමත පරිදි පළාත් ආණ්ඩු ආයතන අහෝසි කිරීමට නොහැකියි. (.....)

09. සන්ධීය ආණ්ඩුක්‍රමය,
1. ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයකින් යුක්ත වේ.
2. පුද්ගල නිදහස ආරක්ෂාකිරීමට ආධාරවන සංවරණ තුලන ජාලයක් නිර්මාණය වී තිබේ.
3. බලතල ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මඟින් නිශ්චිතවම දක්වා ඇත.
4. කාර්යක්ෂමතාවයන් ඉහළ ශක්තිමත් ආණ්ඩු බිහිනොවේ.
5. පරිපාලන පහසුව තකා ස්වාධිපත්‍යය බලය මධ්‍ය ආණ්ඩු වෙත ඒකරාශී කර තිබේ. (.....)

10. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය,
1. අගමැතිවරයා සහ කැබිනට් මණ්ඩලය සාමුහිකව පාර්ලිමේන්තුවට වගකියයි.
2. ආණ්ඩුවේ නායක භූමිකාව ජනාධිපති නිලය වෙතට ගොනුකර ඇත.
3. රාජ්‍ය නායක ජනතා බහුතරයෙන්ම තෝරාපත් කරයි.
4. කැබිනට් මණ්ඩලය දේශපාලන විධායකය වන අතර එහි බලතල සීමිතය.
5. විධායකය ඍජු ලෙසින්ම ව්‍යවස්ථාදායකය මත රඳා නොපවතියි. (.....)

11. ජනාධිපති ආණ්ඩුක්‍රම ආකෘතිය,
1. ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායකය අභිබවා යාමට හැකියාව ඇත.
2. විධායකයේ නාමික ප්‍රධානියා ජනාධිපති වේ.
3. ව්‍යවස්ථාදායකය හා විධායකය එකම මැතිවරණයකින් තේරීපත්වේ.
4. ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා මෙන්ම ආණ්ඩුවේ නායකයාද වේ.
5. විධායක හා ව්‍යවස්ථාදායක බලතල ඒකාබද්ධ වීමට ඉඩ සලසා ඇත. (.....)

12. ලුවිස් ක්‍රිස්බර්ග් විසින් ඉදිරිපත් කරන ලද ගැටුම්වල ජීවන චක්‍රයට අයත් නොවන්නේ මෙයින් කුමක්ද?
1. ගැටුම් පැනනැගීම. 2. ගැටුම උත්සන්න වීම
3. ගැටුම බහු ආගමික සමාජයක තිරස් ව්‍යාප්තියක් වීම. 4. ගැටුමේ උත්සන්නතාව අඩුවීම.
5. ගැටුම කෙළවරවීම. (.....)

13. රාජ්‍යය ප්‍රතිපත්ති ක්‍රියාදාමයේ අවධි කිහිපයක් වේ. ඊට අදාල නොවන්නේ මෙයින් කුමක්ද?
    1. ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය    2. ප්‍රතිපත්ති සම්පාදනය
    3. ප්‍රතිපත්ති ක්‍රියාවට නැඟීම    4. බලය මධ්‍යගතකරණය
    5. ප්‍රතිපත්ති ඇගයීම (.....)

14. ඇමරිකානු ආණ්ඩුක්‍රමයේ සම්භාව්‍ය ෆෙඩරල් ක්‍රමය වෙනත් දිසාවකට ගමන් කිරීම. නව ප්‍රවණතාවයකි. එයට අදාල නොවන හේතුව කුමක්ද?
    1. මුල් කාලයේ ප්‍රාන්ත මට්ටමේ පැවති ගැටලු නූතනයේ ජාතික හා ගෝලීය ගැටලුබවට පත්වීම.
    2. ශීඝ්‍ර ආර්ථික වර්ධනය
    3. ජනතා ආකල්ප වෙනස් නොවීම.
    4. ශක්තිමත් මධ්‍යම ආණ්ඩු ඉල්ලා සිටීම.
    5. විශාල වෙළඳ ව්‍යාපාර බිහිවීම. (.....)

15. ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ පදනම සම්බන්ධයෙන් සාවද්‍ය ලක්‍ෂණය කුමක්ද?
    1. ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක් තිබීම.
    2. අවශ්‍යතා අනුව තත්ත්වානුරූපීව මධ්‍ය ආණ්ඩුව ප්‍රාන්ත අභිබවා ක්‍රියාකිරීම.
    3. නීති සම්පාදන සම්බන්ධතා
    4. මූල්‍ය සම්බන්ධතා
    5. හදිසි අවස්ථා බලතල යටතේ මධ්‍යම රජයට ප්‍රාන්ත විෂයෙහිලා නීති පැනවීමට නොහැකි වීම. (.....)

16. සමාජවාදී නිරාගමිකවාදයේ ප්‍රදාන මූලධර්ම අතරට අදාල නොවන්නේ මින් කුමක්ද?
    1. රාජ්‍යය ආගමෙන් සම්පූර්ණයෙන් වෙනස්විය යුතුය.
    2. ආගමට පැවතිය හැක්කේ රාජ්‍යයේ අවසරය ඇතිව පමණි.
    3. දේශපාලනයේ පුරවැසි සංවිධාන ආගමික අනන්‍යතාව මත ගොඩනැගිය යුතුය.
    4. ආගමික ආයතනවලට පවතින්නට හැකිවන්නේ ඒවා රාජ්‍යයට තර්ජනයක් නොවනතාක් දුරටය.
    5. ආගම ඉගැන්වීම හෝ ප්‍රචාරය කිරීමට රාජ්‍යය සහභාගී විය යුතුය. (.....)

17. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරන සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක්ද?
    1. ආණ්ඩුකාරවරයා සතු අසීමිත බලතල අඩු කිරීම.
    2. ඍජු ප්‍රජාතන්ත්‍රවාදයට මූල බීජ සැපයීම.
    3. රාජ්‍යය වෙළඳ ඒකාධිකාරිය තවදුරටත් ක්‍රියාත්මක වීම.
    4. ද්විත්ව අධිකරණ ක්‍රමය සහ නීති ක්‍රමයක් ඇති කිරීම.
    5. ව්‍යවස්ථාදායක හා විධායක සභා ක්‍රමය ඉවත් කිරීම. (.....)

18. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයට අදාළ ප්‍රකාශය තෝරන්න.
    1. දේශපාලන පක්‍ෂ ක්‍රමයක අවශ්‍යතාව මත පක්‍ෂ බිහිවුණි.
    2. සමාජ සජීවීකරණය මන්දගාමීවුණි.
    3. සර්වජන ඡන්දබලය මත පදනම් වූ නියෝජන ආණ්ඩුක්‍රමයකට පදනම වැටුණි.
    4. සුභ සාධනය අපේක්ෂිත අයුරින් වේගවත් නොවුණි.
    5. ව්‍යවස්ථාදායක සභාව පාර්ලිමේන්තුව නමින් හැඳින්වුණි. (.....)

19. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාල ප්‍රකාශය වන්නේ,
    1. ශ්‍රී ලංකාවට පූර්න නිදහස ප්‍රදානය කිරීමයි.
    2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් ඇතුලත් කිරීමය.
    3. ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කිරීම.
    4. රාජ්‍යයේ නායකත්වය අග්‍රාමාත්‍යවරයාට හිමිවීමය.
    5. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය හඳුන්වාමදීය. (.....)

20. 1972 ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක්ද?
    1. රාජ්‍ය සේවය සම්බන්ධ වගකීම අමාත්‍ය මණ්ඩලයෙන් ඉවත්විය.
    2. සුළුජන රැකවරණය සඳහා වෙනම මණ්ඩලයක් පිහිටුවිය.
    3. ව්‍යවස්ථාදායකය සතු නීතිසම්පාදන බලය උත්තරීතර විය.
    4. උසාවි පද්ධතියේ කිසිදු වෙනසක් සිදුනොවීය.
    5. සාමාජිකයන් 198 කින් සමන්විත ව්‍යවස්ථාදායකයක් නිර්මාණය විය. (.....)

- **21 සිට 25 දක්වා ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශය හෝ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

21. නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක ලක්ෂණ වනුයේ,
A ක්‍රියාකාරී ඵලදායි විපක්ෂයක් නොතිබීම
B නිදහස් සාධාරණ තරගකාරී මැතිවරණ
C වගකීම් සහිත ආණ්ඩුකරණය
D සක්‍රීය සිවිල් සමාජයක පැවැත්ම
E දේශපාලන සංවරණ තුලන ක්‍රමයක් මත පදනම්ව දේශපාලන ආයතන ක්‍රියාවලියක පැවැත්ම.
1. ABCD 2. ABDE 3. ACDE 4.BCDE 5. CDE (.....)

22. සුළු ජන අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම පිළිබඳව සෝල්බරි ව්‍යවස්ථාව සැලසූ නිර්දේශ වන්නේ,
A 29 වන වගන්තියේ ඇතැම් නිර්දේශ
B ආණ්ඩුකාරවරයාගේ නාමකරණයෙන් පත්කළ නියෝජිත පිරිස
C කේවල මැතිවරණ කොට්ඨාස ක්‍රමය
D බහුමන්ත්‍රී කොට්ඨාස ක්‍රමය
E රාජ්‍ය සේවා කොමිසම් සභාව
1. ABCD 2. ABDE 3. ACDE 4.BCDE 5. CDE (.....)

23. පළාත් ආණ්ඩුකාරවරයා,
A මධ්‍යම ආණ්ඩුවේ නියෝජිතවරයා වේ.
B ප්‍රඥප්ති, ප්‍රපිපත්ති තීරණ සම්බන්ධ බලතල හිමිවේ.
C නාමික විධායකය වේ.
D පළාත් මහාධිකරණයට විනිසුරුවන් පත්කරනු ලැබේ.
E පළාත් සභාවට වගකීමට බැඳී සිටියි.
1. ABCD 2. ABCE 3. ACDE 4.BCDE 5. CDE (.....)

24. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය,
A ව්‍යවස්ථා විවරණ බලය හිමි නොවීම
B විනිසුරුවන් පස් දෙනෙකුගෙන් සමන්විත විය.
C පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලභාවය පිරික්සනු ලැබීම
D තීන්දු ගනු ලැබුයේ බහුතර විනිසුරුවන්ගේ ඒකඟතාවයෙනි.
E සෑම තීන්දුවක්ම පැය විසිහතරක් තුළ ලබාදිය යුතුවිය.
1. ABCD 2. ABC 3. BCD 4. ACDE 5. CDE (.....)

25. 19 වන සංශෝධනය මගින් ජනාධිපති වෙත පැවරී ඇති බලතල හා කාර්යයන් ඇතුළත් කාණ්ඩය කුමක්ද?
A පාර්ලිමේන්තු නිල කාලය වසර 6 ක් වීම.
B ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කළයුතු බව.
C මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත ඡන්ද විමසීම් පැවැත්වීම.
D ජාතික ප්‍රතිසංවිධානය සහ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම.
E ස්වාධීන කොමිෂන් සභාවල ක්‍රියාකාරීත්වය පහසු කරලීම.
1. ABCD 2. ABCE 3. ACDE 4. CDE 5. BCDE (.....)

- **26 සිට 30 දක්වා ඇති සෑම ප්‍රශ්නයක් සඳහාම ප්‍රකාශ දෙකක් අඩංගු කර ඇත. එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහතින් දක්වා ඇති හැඳින්වීම් වලින් කවරක්ද යන්න තෝරා 1, 2, 3, 4 ලෙස ඒවා නම් කරන්න.**

| අංකය | ප්‍රකාශ I | ප්‍රකාශ II |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 26 | සිවිල් සමාජය යනු මිනිසුන් එකිනෙකා මුණගැසෙන, පොදු ප්‍රශ්න කථාකරන, හා විසඳුම් සොයන ඉසව්වකි. | පාසල්, වෘත්තීය සමිති, ක්‍රීඩා සමිති, සංවිධාන, ජනමාධ්‍ය, සංස්කෘතික සංවිධාන යනාදිය සිවිල් සමාජයේ අංගයන්ය. (.....) |
| 27 | ප්‍රථම වතාවට සර්වජන ඡන්දබලය හිමිවූයේ ඩොනමෝර් ප්‍රතිසංස්කරණයෙනි. | ඩොනමෝර් ක්‍රමයේ විධායක කාරක සභා ක්‍රමය මඟින් සුළු ජන කොටස්වලටද පාලන කාර්යයට සහභාගි වීමට අවස්ථා උදාවිය. (.....) |
| 28 | පළාත් සභාක්‍රමය යටතේ සැබෑ විධායකයේ නායකයා වූයේ පළාත් ප්‍රධාන අමාත්‍යවරයාය. | පළාත් අමාත්‍යවරයා පත් කරනුයේ ජනාධිපති විසිනි. (.....) |
| 29 | 1978 ආණ්ඩුක්‍රමය යටතේ පාර්ලිමේන්තුව ද්විමාණ්ඩලික සභාවක් වන අතර, එහි නිල කාලය වසර හතරකි. | පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වීම සඳහා තිබිය යුතු ගණ පූර්ණය විස්සකි. (.....) |
| 30 | නූතන ආණ්ඩුක්‍රමය යටතේ අධිකරණයේ ස්වාධීනත්වය බහුමානීය සංකල්පයකි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අධිකරණ ස්වාධීනත්වය පාර්ශව තුනක් සහභාගීත්වයෙන් ආරක්ෂා කළ යුතු මූලධර්මයකි. (.....) |

## B කොටස

31. දේශපාලන විද්‍යාව විෂයය අධ්‍යයනයයේදී අවධානය යොමු කළ යුතු මූලික ක්ෂේත්‍ර දෙකකි. ඒවා නම් කරන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

32. රාජ්‍යය මනුෂ්‍ය සංවිධාන අතර ඉහළම සංවිධානය වන බවට අදහස් ඉදිරිපත් කළ ප්‍රධාන දේශපාලන චින්තකයින් දෙදෙනා නම් කරන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

33. ජාතිකවාදය ප්‍රධාන ප්‍රවේශ තුනක් ඔ(ස්සේ හඳුනාගත හැකිය. එයින් දෙකක් ලියන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

34. පහත ලක්ෂණ අඩංගු රාජ්‍ය මාදිලි දෙක නම් කරන්න.

(i) රාජ්‍ය පරමෝත්තම සංවිධානයකි. ..........................................................................................

(ii) රාජ්‍ය සුභ සාධක සංවිධානයකි ..........................................................................................

35. ''ජනගහන න්‍යාය'' සහ ස්වභාවික තේරීම පිළිබඳ න්‍යාය ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනා නම් කරන්න.

(i) ජනගහණ න්‍යාය ..........................................................................................

(ii) ස්වභාවික තේරීම පිළිබඳ න්‍යාය ..........................................................................................

36. මාක්ස්වාදීන් රාජ්‍ය දෙයාකාරයකින් සලකා බැලූහ. ඒවා නම් කරන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

37. නිර්බාධවාදී රාජ්‍යය ක්‍රමයේ පවතින ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) ..........................................................................................

(ii) ..........................................................................................

38. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක බහුතරය සොයා බලන අවස්ථා ගණනාවකි. එයින් දෙකක් නම් කරන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

39. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය හඳුන්වාදුන් ප්‍රධාන චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

40. බලතල බෙදීමේ න්‍යායෙන් අපේක්ෂා කරන කරුණු දෙකක් ලියන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

41. ගැටුම් සම්බන්දයෙන් ප්‍රයෝජනවත් වන ප්‍රවේශ ගණනාවකි. එයින් දෙකක් ලියන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

42. ඇමරිකානු ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික විය. එම ආයතන දෙක නම් කරන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

43. ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හදිසි අවස්ථා වර්ග තුනක් සඳහන් කර තිබේ. ඉන් දෙකක් දක්වන්න.

(i) ..........................................................................................................................................

(ii) ..........................................................................................................................................

44. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙහි දේශපාලන විධායකය සහ එරට ඉහළම අධිකරණ ආයතනය කුමක්ද?.

(i) ..........................................................................................................................................

(ii) ..........................................................................................................................................

45. පහත කරුණු සම්බන්ධයෙන් කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ගෙනා යෝජනා නම් කරන්න.

(i) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ගමන්මගෙහි ආරම්භය

..........................................................................................................................................

(ii) ධනවාදී ආර්ථික ක්‍රමය ස්ථාපිත කිරීම

..........................................................................................................................................

46. සොල්බරි ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවා කොමිෂම පත් කිරීමට හේතු දෙකකි. ඒවා සඳහන් කරන්න.

(i) ..........................................................................................................................................

(ii) ..........................................................................................................................................

47. අධිකරණ සේවය පාලනය කිරීම සඳහා 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මණ්ඩල දෙක නම් කරන්න.

(i) ..........................................................................................................................................

(ii) ..........................................................................................................................................

48. (i) රාජය සේවා කොමිෂම ප්‍රථම වතාවට හඳුන්වාදෙන ලද්දේ කිනම් ආණ්ඩුක්‍රමය යටතේද?

..........................................................................................................................................

(ii) එහි අහෝසි කරන ලද්දේ කිනම් ආණ්ඩුක්‍රමයකින්ද?

..........................................................................................................................................

49. ජනතා පරමාධිපත්‍යය ක්‍රියාවට නැංවීම සඳහා 1978 ව්‍යවස්ථාව මගින් පිහිටුවා ඇති විධිවිධාන දෙක නම් කරන්න.

(i) ..........................................................................................................................................

(ii) ..........................................................................................................................................

50. (i) ශ්‍රී ලංකාවේ පළාත් සභා ස්ථාපිත කළේ කිනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්ද?

..........................................................................................................................................

(ii) එම පළාත් සභාවල ප්‍රධාන විධායක තනතුර නම් කරන්න.

..........................................................................................................................................

(31 - 50 ප්‍රශ්නවලට ලකුණු 2 බැගින්)